අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2023(2024)

# අනුහුරු ප්‍රශ්න පත්‍රය
# மாதிரி வினாத்தாள்
# Model Paper

# Geography
# භූගෝල විද්‍යාව



**Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව දුරස්ථ අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 61 | S | I, II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2023 (2024)
G. C. E. Ordinary Level Examination - Model Paper - 2023 (2024)
க.பொ.த சாதாரண தரப் பரீட்சை - மாதிரி வினாத்தாள் - 2023 (2024)

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I, II |
| புவியியல் | I, II |
| Geography | I, II |

පැය තුනයි.
மூன்று மணித்தியாலம்
Three Hours

| | |
|---|---|
| අමතර කියවීම් කාලය | - මිනිත්තු 10 යි. |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | – 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## භූගෝල විද්‍යාව I

**සැලකිය යුතුයි:**

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූල ව සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

- අංක **01** සිට **05** දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

**01.** පෘථිවි තලයේ සිට ......................... අතර කලාපය තුළ මුළු වායු පරිමාවෙන් අඩක් ම අන්තර්ගත වේ.
**(4 - 5 km / 5 - 6 km / 6 - 7 km)**

**02.** ......................... ඉහළ ජන ව්‍යාප්තියක් සහිත අග්නිදිග ආසියාතික රටකි.
(ජපානය / දකුණු කොරියාව / ඉන්දුනීසියාව)

**03.** ශ්‍රී ලංකාවේ පෙට්‍රෝලියම් පිරිපිහදු කිරීමේ කර්මාන්තශාලාව ......................... පිහිටා ඇත.
(ඔරුගොඩවත්ත / සපුගස්කන්ද / කෙරවලපිටිය)

**04.** පෘථිවියේ අධික තාපය හා පීඩනය යටතේ නිර්මාණය වන ......................... පාෂාණ, මූලික පාෂාණයක් ලෙස හැඳින්වේ. (විපරිත / ආග්නේය / අවසාදිත)

**05.** ශ්‍රී ලංකාවේ වී වගා කරන ප්‍රදේශ පාරිසරික කලාප ......................... කට වෙන් කර දක්වයි.
**(3 / 4 / 5)**

- අංක **06** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් 'නි' යන්න වටා ද, වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.

**06.** පතුරු පාෂාණ ආකාරයෙන් පවතින මිනිරන් ඉහළ වටිනාකමකින් යුක්ත ය. නි / වැ

**07.** බෝල්ටික් මුහුද අර්ධ වශයෙන් ගොඩබිමින් වට වී ඇත. නි / වැ

**08.** දේශගුණ ව්‍යාප්තිය පිළිබඳ මුල් ම අදහස ඉදිරිපත් කරනු ලැබුවේ ඇරිස්ටෝටල් විසිනි. නි / වැ

**09.** ලැව්ගිනි ජීව විද්‍යාත්මක උපද්‍රවයකි. නි / වැ

**10.** හම්බන්තොට බරුතකන්ද ප්‍රදේශයේ සුළං බලාගාරයක් පිහිටා ඇත. නි / වැ

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**11.** පෘථිවිය මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර මිලියන ......................................... කි.


**12.** කතරගම අයත් වන්නේ ......................................... සංචාරක කලාපයට ය.

**13.** **1992** දී රියෝ ද ජැනයිරෝ නගරයේ දී ......................................... සමුළුව පවත්වන ලදි.

**14.** වළාකුළු හා පොළොව අතර සිදු වන විදුලි විසර්ජනය ......................................... ලෙස හඳුන්වයි.

**15.** ශ්‍රී ලංකාවේ පළමු රබර් පැළය රෝපණය කරන ලද්දේ ......................................... උද්‍යානයේදී ය.

- අංක 16 සිට 19 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාරය උපයෝගී කර ගන්න.
  2014 - 2022 කාලයේ දී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව පහත ප්‍රස්තාරයෙන් දක්වා ඇත.




16. ශ්‍රී ලංකාවට වැඩි ම සංචාරකයින් සංඛ්‍යාවක් පැමිණ ඇත්තේ .................. වර්ෂයේ දී ය.

17. අවම සංචාරකයින් පිරිසක් පැමිණ ඇත්තේ .................. වර්ෂයේ දී ය.

18. 2019 වර්ෂයෙන් පසු ශ්‍රී ලංකාවට පැමිණි මුළු සංචාරකයින් සංඛ්‍යාව .................. කි.

19. .................. සහ .................. වර්ෂවල දී සමාන සංචාරකයින් සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවට පැමිණ ඇත.

- අංක 20 සිට 25 තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙළට අනුව 'ආ' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.

20.

| 'අ' වනාන්තර වර්ගය | 'ආ' ලක්ෂණය |
|---|---|
| 1- කේතුධර | A - පැහැදිලි ස්තරායනයක් නැත |
| 2- නිවර්තන වර්ෂා | B - ඉදිකටු වැනි ශාක පත්‍ර ඇත |
| 3- සෞම්‍ය කලාපීය | C - ජෛව විවිධත්වය ඉහළ ය |
| | D - පැළෑටි වර්ධනය මන්දගාමී ව සිදු වේ |

(1) ABC (2) ACD (3) BCA (4) DBA (.......)

21.

| 'අ' ප්‍රදේශය | 'ආ' වනජීවී රක්ෂිත වර්ග |
|---|---|
| 1- නකල්ස් | A - ජාතික උද්‍යාන |
| 2- රිටිගල | B - අභයභූමි |
| 3- ආනවිලුන්දාව | C - වනරක්ෂිත |
| | D - දැඩි ස්වාභාවික රක්ෂිත |

(1) ABC (2) ADC (3) CAB (4) CDB (.......)

22.

| 'අ' උපද්‍රව වර්ගය | 'ආ' ආපදාව |
|---|---|
| 1- භූ විද්‍යාත්මක උපද්‍රව | A - සුනාමි |
| 2- දේශගුණ විද්‍යාත්මක උපද්‍රව | B - වසංගත |
| 3- ජීව විද්‍යාත්මක උපද්‍රව | C - භූමිකම්පා |
| | D - නියඟ |

(1) BAD (2) CDA (3) CDB (4) DAB (.......)

23. 'අ' 'ආ'

| ලක්ෂණය | වායුගෝලීය ස්තර |
|---|---|
| 1- සාමාන්‍ය ගුවන් යානා පියාසර කරයි | A - තාපගෝලය |
| 2- අහිතකර සූර්ය විකිරණ පාලනය කරයි | B - මෙසෝගෝලය |
| 3- අඩු ම උෂ්ණත්වයක් පවතියි | C - අපරිවර්තිගෝලය |
| | D - පරිවර්තිගෝලය |

(1) DAC (2) DBA (3) DCA (4) DCB (.......)

24. 'අ' 'ආ'

| සාගරය | දූපත් |
|---|---|
| 1- පැසිපික් සාගරය | A - තස්මේනියාව |
| 2- ඉන්දියන් සාගරය | B - තායිවානය |
| 3- අත්ලන්තික් සාගරය | C - සීෂෙල්ස් දූපත් |
| | D - කැනරි දූපත් |

(1) ABC (2) BCD (3) CBA (4) DCA (.......)

25. 'අ' 'ආ'

| පස් වර්ගය | බෝගය |
|---|---|
| 1- ලෝම ලැටරයිට් පස | A - තේ |
| 2 - ලවණ මිශ්‍ර වැලි පස | B - පොල් |
| 3- කබොක් මිශ්‍ර රතු පස | C - රබර් |
| | D - කෝපි |

(1) ABC (2) BCD (3) CBA (4) DCA (.......)

- අංක 26 සිට 36 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.

26. ආසියාතික රටවල ශ්‍රම සූක්ෂම වගාවක් වන්නේ,

(1) තිරිඟු ය. (2) රබර් ය. (3) තේ ය. (4) වී ය. (.......)

27. ශ්‍රී ලංකාවේ මැදරට තේ වගාකරන දිස්ත්‍රික්කයක් දැක්වෙන වරණය කුමක් ද ?

(1) මාතලේ (2) නුවරඑළිය (3) කෑගල්ල (4) ගාල්ල (.......)

28. වර්තමානයේ දී මෝටර් රථ නිෂ්පාදනයේ ප්‍රමුඛ රටවල් දහය අතර ඇති දකුණු ඇමරිකානු රට වන්නේ,

(1) කොලොම්බියාව යි. (2) ආර්ජන්ටිනාව යි. (3) බ්‍රසීලය යි. (4) උරුගුවේ ය. (.......)

29. ලොව පැරණි ම සිතියම නිර්මාණය කරන ලදැයි සැලකෙන්නේ,

(1) ඉන්දියානු ජාතිකයකු විසිනි. (2) මෙසපොතේමියානු ජාතිකයකු විසිනි.
(3) අප්‍රිකානු ජාතිකයකු විසිනි. (4) යුරෝපීය ජාතිකයකු විසිනි. (.......)

30. ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග අතරින් E4 මාර්ගය වනුයේ,

(1) මධ්‍යම අධිවේගී මාර්ගය යි. (2) කොළඹ - පිටරවුම් අධිවේගී මාර්ගය යි.
(3) දක්ෂිණ අධිවේගී මාර්ගය යි. (4) කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය යි. (.......)

31. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම කෙරෙහි බලපාන ස්වාභාවික සාධකයක් වන්නේ ,

(1) සත්ත්ව පාලනය යි. (2) න්‍යෂ්ටික අත්හදා බැලීම යි.
(3) සූර්ය ලප යි. (4) කාර්මීකරණය යි. (.......)

32. මානුෂ සංවර්ධන දර්ශකය ගණනය කිරිමේ දී යොදා ගන්නා ප්‍රධාන නිර්ණායකයක් වන්නේ,

(1) උපතේ දී ආයු අපේක්ෂාව යි. (2) මාතෘ මරණ අනුපාතිකය යි.
(3) ළදරු මරණ අනුපාතිකය යි. (4) වියපත් ජන සංඛ්‍යාව යි. (.......)

33. රතු කහ පොඩ්සොල් පසෙහි දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ මින් කුමක්ද ?
(1) අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්කවල වැඩි වශයෙන් ව්‍යාප්ත ව ඇත.
(2) එළවළු සහ තෘණ වගාවන්ට සුදුසු ය.
(3) ගංගා මිටියාවත්වල හා තැනිබිම්වල ව්‍යාප්ත ව ඇත.
(4) පහතරට තෙත් කලාපීය දිස්ත්‍රික්කවල ව්‍යාප්ත ව ඇත. (.......)

34. 2012 මහ බැංකු වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ ඉහළ ම අපනයන ආදායමක් ලැබූ කෘෂිකාර්මික බෝගය මින් කුමක්ද ?
(1) පොල් (2) තේ (3) කුළුබඩු (4) රබර් (.......)

35. සේනානායක සමුද්‍රය ඉදිකර ඇත්තේ කුමන ගංගාව මුල්කර ගෙන ද?

(1) වලවේ ගඟ (2) කුඹුක්කන් ඔය (3) ගල් ඔය (4) කැලණි ගඟ (.......)

36. 1:50,000 භූ ලක්ෂණ සිතියමෙහි කහ වර්ණයෙන් යුක්ත සංකේත යුගලයක් නිවැරදි ව දැක්වෙන පිළිතුර වන්නේ,
(1) තේ වගාව සහ අප්‍රධාන මාර්ගය (2) ප්‍රධාන මාර්ගය සහ රබර් වගාව
(3) ගෙවතු වගාව සහ වැව් බැම්ම (4) අප්‍රධාන මාර්ගය සහ ගෙවතු වගාව (.......)

- පහත A, B, C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 37 සිට 40 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. මරණ සංඛ්‍යාව
  2. ස්වාභාවික වර්ධනය

B - 1. උන්නතාංශය
  2. වායු පීඩනය

C - 1. රසායනික පොහොර භාවිතය
  2. පරිසර දූෂණය

D - 1. සාක්ෂරතාවය
  2. ජන සංඛ්‍යාව වියපත් වීම

37. පළමුවැන්නේ අඩු වීම දෙවැන්නේ අඩු වීමට මෙන් ම, පළමුවැන්න වැඩි වීම දෙවැන්නේ වැඩි වීමට ද හේතු වන මාතෘකා යුගලය කුමක්ද ?

(1) A (2) B (3) C (4) D (.......)

38. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නේ අඩු වීමට හේතු වුව ද, එය අයහපත් ලක්ෂණයක් වන මාතෘකා යුගලය කුමක්ද ?

(1) A (2) B (3) C (4) D (.......)

39. පළමුවැන්නේ අඩු වීම දෙවැන්නේ වැඩිවීමට හේතු වන මාතෘකා යුගලය කුමක්ද ?

(1) A (2) B (3) C (4) D (.......)

40. ඉහත ප්‍රකාශ අතර සම්බන්ධතාවයක් නොදක්වන මාතෘකා යුගලය වන්නේ මින් කුමක්ද ?

(1) A (2) B (3) C (4) D (.......)

* * * *

ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 61 | S | I, II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2023 (2024)
G. C. E. Ordinary Level Examination - Model Paper - 2023 (2024)
க.பொ.த சாதாரண தரப் பரீட்சை- மாதிரி வினாத்தாள் - 2023 (2024)

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I, II |
| புவியியல் | I, II |
| Geography | I, II |

භූගෝල විද්‍යාව II

- මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය.
- I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් තුනට ම පිළිතුරු සැපයිය යුතු ය.
- II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුයි.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

## I කොටස

**1.** **(අ)** ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ **1:50,000** භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.

i. Ⓐ - Ⓑ රේඛාවෙන් දැක්වෙන ලක්ෂණය කුමක්ද ?
(නිම්නය / මද බෑවුම / රළු බිම) (ලකුණු 01)

ii. Ⓒ අක්ෂරයෙන් දැක්වෙන චතුරස්‍රය තුළ දක්නට ලැබෙන ව්‍යාපාරික බෝග වගාව කුමක් ද ?
(පොල් / වී / තේ) (ලකුණු 01)

iii. Ⓓ අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද ?
(ප්‍රදීපාගාරය / තානායම / වරාය) (ලකුණු 01)

iv. Ⓔ අක්ෂරයෙන් දැක්වෙන මායිම කුමක් ද ?
(ග්‍රාම නිලධාරි කොට්ඨාස / පළාත් / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස) (ලකුණු 01)

v. Ⓚ වෘත්තය තුළ දක්නට ලැබෙන ජලවහන ලක්ෂණය කුමක් ද ?
(හැඩපලු / ගං දහරය / දිය බෙත්ම ) (ලකුණු 01)

vi. සිතියමේ දුම්රියපොළ දෙක අතර දුර කිලෝමීටර් වලින් ගණනය කරන්න. (ලකුණු 01)

vii. Ⓕ අක්ෂරයෙන් දක්වා ඇති රේඛාව නම් කරන්න. (ලකුණු 01)

viii. Ⓖ චතුරස්‍රය තුළ දක්නට ලැබෙන පොදු සේවා සපයන ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ix. Ⓗ අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක්ද ? (ලකුණු 01)

**(ආ)** ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබද ව දක්වා ඇති තීරුව යොදා ගන්න.

- අංක **(i)** සිට **(v)** දක්වා එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, සිතියමට යාබද ව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

i. පාමීර් සානුව - Ⓢ, Ⓣ, Ⓤ
ii. සැක්‍රමැන්ටෝ ගංගාව - Ⓜ, Ⓝ, Ⓞ
iii. කියුබාව - Ⓥ, Ⓦ, Ⓧ
iv. අයර් විල - Ⓒ, Ⓓ, Ⓔ
v. කුෂ්නෙට්ස්ක් - Ⓟ, Ⓠ, Ⓡ (ලකුණු 05)

**(ඉ)** ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබද ව දක්වා ඇති තීරුව යොදා ගන්න.

- අංක **(i)** සිට **(v)** දක්වා එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, සිතියමට යාබද ව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

i. බෝඹුවල වී පර්යේෂණ ආයතනය - Ⓖ, Ⓗ, Ⓘ
ii. බෝගල පතල - Ⓐ, Ⓑ, Ⓒ
iii. ශ්‍රී ලංකාවේ ප්‍රථම සූර්ය පැනල බලාගාරය (සෝලා යුනිවර්ස්)- Ⓓ, Ⓔ, Ⓕ
iv. වරාය නගරය - Ⓞ, Ⓟ, Ⓠ
v. රබර් වගාව සඳහා නව වගා බිම් හඳුන්වා දුන් දිස්ත්‍රික්කය - Ⓛ, Ⓜ, Ⓝ

(ලකුණු 05)

---

## II කොටස

**2. (i)** වායුගෝලය යන්න හඳුන්වන්න. (ලකුණු 02)

**(ii)** පරිවර්තිගෝලය තුළ කැපී පෙනෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

**(iii)(a)** වායුගෝලය දූෂණය වීමට බලපාන මානව ක්‍රියාකාරකම් දෙකක් දක්වන්න. (ලකුණු 02)

**(b)** ඉහත ඔබ දැක්වූ මානව ක්‍රියාකාරකම් මඟින් ඇති වන බලපෑම අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් යෝජනා කරන්න. (ලකුණු 03)

**3. (i)** ලෝකයේ තේ වගාව සිදුකරන ආසියාතික නොවන රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

**(ii)** වතු කෘෂිකර්මාන්තයේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් දක්වන්න. (ලකුණු 03)

**(iii)(a)** තේ නිෂ්පාදනය වැඩි දියුණු කර ගැනීම සඳහා ලෝකයේ විවිධ රටවල් අනුගමනය කරන ක්‍රියාමාර්ග දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

**(b)** තේ නිෂ්පාදනය තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇති ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.(ලකුණු 03)

**4. (i)** ලෝක ජන සංඛ්‍යාවෙන් වැඩි ම ප්‍රමාණයක් වාසය කරන මහාද්වීප දෙක නම් කරන්න. (ලකුණු 02)

වයස් කාණ්ඩ අනුව ජනසංඛ්‍යාව - 2012

| වයස් කාණ්ඩ | ප්‍රතිශතය % |
|---|---|
| ළමා යැපෙන්නන් | 25.8 |
| ශ්‍රම බලකාය | 62.0 |
| වැඩිහිටි යැපෙන්නන් | 12.2 |

පුමිතිරි බව අනුව ජනසංඛ්‍යාව - 2012

| පුමිතිරි බව | ප්‍රතිශතය % |
|---|---|
| පුරුෂ | 48.5 |
| ස්ත්‍රී | 51.5 |

**(ii)** ඉහත **2012** ජන සංගණන වාර්තා දත්ත වලට අනුව ශ්‍රී ලංකා ජන සංඛ්‍යා ව්‍යූහයේ හඳුනාගත හැකි ලක්ෂණ තුනක් දක්වන්න. (ලකුණු 03)

**(iii)** ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යාව වියපත් වීම නිසා මුහුණ දෙන ගැටලු තුනක් නම් කර, ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)


**5. (i) 2008 - 2013** ලෝකයේ විද්‍යුත් උපකරණ නිෂ්පාදනය හා වෙළෙඳාමේ ප්‍රමුඛ රටවල්/කලාප දෙක නම් කරන්න. (ලකුණු 02)

**(ii)** ලෝකයේ විද්‍යුත් කර්මාන්තයේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

**(iii) (a)** විද්‍යුත් උපකරණ භාවිතයේ දී මතුවන ගැටලු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

**(b)** ශ්‍රී ලංකාවේ විද්‍යුත් කර්මාන්තය ආශ්‍රිත ප්‍රවණතා දෙකක් නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

6.




(i) මෙම සිතියමේ A හා B ලෙස සඳහන් සංචාරක කලාප දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ගැටලු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ මෑත කාලීන ප්‍රවණතා තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

7. (i) පහත සඳහන් සාගරික ප්‍රදේශ ආශ්‍රිත ව ක්‍රියාත්මක වන සුළි සුළං හඳුන්වන නම් ලියා දක්වන්න.


(a) බෙංගාල බොක්ක අවට ඉන්දියන් සාගරය ආශ්‍රිත ප්‍රදේශයේ දී

(b) ඕස්ට්‍රේලියාවේ වයඹ දිග වෙරළට ආසන්න ඉන්දියන් සාගර ප්‍රදේශයේ දී (ලකුණු 02)

(ii) සුළි සුළං ආපදාව නිසා භෞතික හා මානව පරිසරයට සිදු වන බලපෑම් තුනක් සඳහන් කරන්න.(ලකුණු 03)

(iii) ඉහත ආපදාවට ප්‍රතිචාර දැක්වීමේ දී, ගන්නා ක්‍රියාමාර්ග තුනක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

8. (i) පහත රූප සටහනෙහි A හා B අවස්ථා දෙක නම් කරන්න. (ලකුණු 02)




(ii) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට බලපාන හරිතාගාර වායු වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii)(a) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමෙන් මානුෂ කටයුතුවලට ඇතිකරන අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) දේශගුණ විපර්යාස මගින් ඇතිවන බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

*****

භූගෝල විද්‍යාව II

Geography II

**1· (අ) / (a)**

I. ------------------------------------------------------------------------

II. ------------------------------------------------------------------------

III. ------------------------------------------------------------------------

IV. ------------------------------------------------------------------------

V. ------------------------------------------------------------------------

VI. ------------------------------------------------------------------------

VII. ------------------------------------------------------------------------


VIII. ------------------------------------------------------------------------

------------------------------------------------------------------------

IX. ------------------------------------------------------------------------

10

(ආ) /(b)




N

(i)

(ii)


(iii)

(iv)

(v)

5

(ඉ) /(c)




N

(i)

(ii)

(iii)

(iv)


(v)

5

1. (අ) ___ /10 (a) ___ /5 (ආ) (b) ___ /5 = (ඉ) (c) /20

# අ.පො.ස. (සාමාන්‍ය පෙළ) අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2023 (2024)
## භූගෝල විද්‍යාව

| 61 | S | II |
|---|---|---|




N

1:50,000